# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2412/09 - 2024 නොවැම්බර් මස 26 වැනි අඟහරුවාදා - 2024.11.26**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 106 (1) සහ 31(2) වගන්ති සමග කියවිය යුතු 105 වගන්තිය යටතේ සකස් කළ රීති.

ආචාර්ය **පී. නන්දලාල් වීරසිංහ,**
මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.
2024 නොවැම්බර් මස 26 වැනි දින.

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදිත රීති**

1. මෙම රීති 'ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළඳපොළ කටයුතු සඳහා වන 2024 අංක 1 දරන රීති' යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 31(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින්, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන **එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය** හඳුන්වා දීමත් සමග, 2024 නොවැම්බර් 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විවට වෙළඳපොළ කටයුතුවලට අදාළ මෙහෙයුම්වල වෙනස්කම් මෙයින් හඳුන්වා දෙනු ලැබේ.

3. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය නිල වශයෙන් පිළිබිඹු කිරීම සහ සන්නිවේදනය කිරීම සඳහා, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, අවශ්‍යතාව අනුව සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම වරින් වර සිදු කරනු ලැබේ.

4. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් කලින් තීරණය කරන ලද ආන්තික හරහා එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කරනු ලැබේ.


1A - G 43118 — 24 (2024/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සහ/හෝ කලින් තීරණය කරන ලද ආන්තිකවලට අදාළව සිදු කරනු ලබන වෙනස්කම්, මහ බැංකුව විසින් වෙළඳපොළ සහ මහජනතාව වෙත නිවේදනය කරනු ලැබේ.

6. ඒ අනුව, මහ බැංකුව විසින් විවට වෙළඳපොළ කටයුතු සිදු කරනු ලැබීමේදී සහභාගිත්ව ආයතන සඳහා පහත රීති අදාළ විය යුතුය.

6.1 විවට වෙළඳපොළ කටයුතු යටතේ වන ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් වෙන්දේසිවලට ලංසු ඉදිරිපත් කරනු ලබන සියලුම සහභාගිත්ව ආයතන මෙම රීති සඳහා අනුගත විය යුතුය.

6.1.1 සහභාගිත්ව ආයතන විසින්, කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි යටතේ, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සමානව හෝ ඊට ඉහළ අනුපාතිකයකට ඉදිරිපත් කරනු ලබන ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කෙරේ.

6.1.2 සහභාගිත්ව ආයතන විසින්, කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි යටතේ, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සමානව හෝ ඊට පහළ අනුපාතිකයකට ඉදිරිපත් කරනු ලබන ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කෙරේ.

7. විවට වෙළඳපොළ කටයුතුවලට අදාළව පවතින මෙහෙයුම් උපදෙස් සහ මෙම රීති අතර අනුකූලතාවක් ඇති නොවන අවස්ථාවලදී, මෙම රීති බල පැවැත්විය යුතුය.

මෙම රීතිවල කාර්යය සඳහා,

i. "මහ බැංකුව" යන්නෙන් අදහස් වන්නේ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව වේ.

ii. "මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය" යන්නෙන් අදහස් වන්නේ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පිහිටුවන ලද තීරණ ගැනීමේ බලයලත් අධිකාරිය වේ.

iii. "එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය" යන්නෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය නිල වශයෙන් පිළිබිඹු කරනු ලබන සහ සන්නිවේදනය කරනු ලබන ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වේ.

iv. "නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය" යන්නෙන් අදහස් වන්නේ නිත්‍ය පහසුකම යටතේ එක්දින පදනමක් මත, සහභාගිත්ව ආයතන සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් හට (බලපත්‍රලාභී වාණිජ බැංකු හැර ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස පත්කරන ලද සමාගම්) සිය අතිරික්ත අරමුදල්, මහ බැංකුවේ තැන්පත් කළ හැකි අනුපාතිකයයි.

v. "නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය" යන්නෙන් අදහස් වන්නේ නිත්‍ය පහසුකම යටතේ එක්දින පදනමක් මත, සහභාගිත්ව ආයතන සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් හට (බලපත්‍රලාභී වාණිජ බැංකු හැර ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස පත්කරන ලද සමාගම්) මහ බැංකුවෙන් අරමුදල් ලබා ගත හැකි අනුපාතිකයයි.

vi. "සහභාගිත්ව ආයතන" යන්නෙන් අදහස් වන්නේ විවට වෙළඳපොළ කටයුතු යටතේ කෙටිකාලීන වෙන්දේසි සඳහා සුදුසුකම් ලබන සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ සේවක අර්ථසාධක අරමුදල වේ.

vii. "කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි" යන්නෙන් අදහස් වන්නේ ප්‍රතිමිලදීගැනුම් ගනුදෙනු වෙනුවෙන් පවත්වනු ලබන කෙටිකාලීන වෙන්දේසි (ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම සඳහා) වේ. කෙටිකාලීන වෙන්දේසිවල කාල සීමාව එක් දිනක සිට දින 07ක් (සතියක්) දක්වා වේ.

viii. "කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි" යන්නෙන් අදහස් වන්නේ ප්‍රතිවිකුණුම් ගනුදෙනු වෙනුවෙන් පවත්වනු ලබන කෙටිකාලීන වෙන්දේසි (ද්‍රවශීලතාව සැපයීම සඳහා) වේ. කෙටිකාලීන වෙන්දේසිවල කාල සීමාව එක් දිනක සිට දින 07ක් (සතියක්) දක්වා වේ.

EOG 11 - 0150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.